**මාතර මහා නගර සභාව**
**මාතර දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාවට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.256,483 ක් වූ ආයුර්වේද ඖෂධ තොගය සහ රු.526,812 ක් වූ වාහන සේදුම් මධ්‍යස්ථානයේ ඉතිරි තොගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඍජු මිළදී ගැනීම් ඍජු භාවිතය සඳහා නිකුත් කිරීම සිදුකරයි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට විහාරස්ථාන සඳහා දහම් පාසල් උපකරණ ලබාදීමේ යෝජනාව වෙනුවෙන් රු.200,000 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ණයහිමි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ඉදිකිරීමේ වියදම් වෙනුවෙන් ණයහිමි යටතේ ප්‍රතිපාදන රු.6,480,445 ක් අඩුවෙන් සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ප්‍රතිපාදන ලෙස ලබා දී ඇත්තේ කර්මාන්ත සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු මුදල බවත් ණය හිමි/ණය ගැති ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කර්මාන්ත ණයගැති වෙනුවෙන් රු. 3,416,811 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ප්‍රතිපාදන ලෙස ලබා දී ඇත්තේ කර්මාන්ත සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු මුදල බවත් ණය හිමි/ණය ගැති ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු එකතුව රු.45,992,645 ක් වූ දායකය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් ගෙවන ලද රු.397,506 ක ණය පොලිය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පොලී මුදල ගිණුම් ගත කිරීම බැංකු සැසඳුම්පත්‍රය ලැබීමෙන් පසු සිදු කරනු ලබයි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු.759,550 ක් වූ කාර්යාල උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | ඉකුත් වර්ෂයේ වෙන්දේසියෙන් ඉවත් කර තිබූ ස්ථාවර වත්කම්වල පිරිවැය නිශ්චිතව හඳුනානොගෙන ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමයට රු.1,351,273 ක් ගිණුම්වලින් ඉවත්කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | සාක්ෂියක් නොමැති බැවින් පැරණි වටිනාකම් පදනම් කරගෙන අදාළ ඉවත් කිරීම ගිණුම්ගත කරන ලදි. |
| (ix) | 2015 හා 2016 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.331,829 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | සාක්ෂියක් නොමැති බැවින් පැරණි වටිනාකම් පදනම් කරගෙන අදාළ ඉවත් කිරීම ගිණුම්ගත කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| (x) | එකතු වටිනාකම රු.13,701,000 ක් වූ වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක් සහ වටිනාකම හඳුනානොගත් වාහන හා යන්ත්‍රෝපකරණ 04 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳූ ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.153,788,163 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.26,773,192 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | හඳුනා ගැනීමෙන් අනතුරුව නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.108,166,858 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට, ශේෂ සනාථ සහතික ලබාගෙන ඉදිරිපත් කිරීමට හා විස්තරාත්මක උපලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ---------------- | ----------------- | ------------ | ---------------- |
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 254(අ) වගන්තිය | සභාවට අයවිය යුතු සියළු බදු, දඩ මුදල් සහ දඩුවමක් වශයෙන් වූ මුදල් අයකරගෙන එම මුදල් මහා නගර සභාවේ අරමුදලට බැර කිරීම සඳහා සියළු පියවර ගැනීම නාගරික කොමසාරිස්ගේ කාර්යය වුවද, ඉකුත් වර්ෂය අවසානයට වූ රු.443,800,641 ක හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධානයන් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුද්දර ගාස්තු, ලැබියයුතු උසාවි දඩ, වීථි පහන් සඳහා ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීම සඳහා අදාළ ආයතන වෙත ලිපි යවා ඇති අතර අනිකුත් ආදායම් අයකරගැනීමට අදාල කටයුතු සිදු කර ඇත. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මහා නගර සභාව සතු වාහන 38 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 ජුනි හා ජූලි මාස තුළ ඉන්ධන පරීක්ෂාව සිදුකර අවසන් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කර තිබූ රු.11,278,000 ක් වටිනා වාහන 92 ක අපහරණ කටයුතු 2019 මැයි 03 දිනය වන විටත් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අපහරණ වාහන වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.132,779,713 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.157,500,775 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වර්ෂ 10 ත් වර්ෂ 27 ත් අතර කාල පරිච්ඡේදයකට අයත් රු.34,943 ක් වූ අහරු චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිශ්චිත තොරතුරු සොයාගැනීමට නොහැකි බැවින් සභාව වෙත යොමුකර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ජංගම වත්කම් යටතේ පැහැරගත් මුදල් ශේෂයක් ඇතුළත් කිරීම නිසා, ජංගම වත්කම් තුළ රු.169,360 ක ව්‍යාජ වත්කම් ඇතුළත් වී තිබූ අතර අදාළ මුදල පැහැර ගැනීම සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම පැහැරගත් මුදල් ශේෂය සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරක් වාර්තා නොවන බැවින් අදාල ශේෂය පෙර වර්ෂ වල සිට පැවත එන්නකි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 41,384,570 | 38,481,722 | 43,527,300 | 56,075,504 | 37,073,065 | 38,595,208 | 37,544,395 | 60,368,667 |
| කුලී | 26,381,440 | 30,606,691 | 29,824,618 | 58,759,275 | 27,671,963 | 28,038,858 | 27,203,800 | 63,668,754 |
| බලපත්‍ර ගාස්තු | 26,874,700 | 30,135,817 | 25,683,882 | 1,386,660 | 18,802,100 | 27,103,902 | 24,387,784 | 1,386,660 |
| වෙනත් ආදායම් | 93,542,300 | 113,606,910 | 4,791,667 | 327,579,202 | 84,102,800 | 118,580,281 | 5,514,055 | 236,999,202 |
| එකතුව | 188,183,010 | 212,831,140 | 103,827,467 | 443,800,641 | 167,649,928 | 212,318,249 | 94,650,034 | 362,423,283 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම රු.188,183,010 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.362,423,283 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.212,831,140 ක් සමඟ රු.575,254,423 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.103,827,467 ක් පමණක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.443,800,641 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | සමාලෝචිත වර්ෂය අවසානයට අය වියයුතු හිඟ මුදල ලෙස දක්වා ඇති රු.443,800,641 න් වැඩි වටිනාකම වන රු.333,686,089 මුද්දර ගාස්තු, ලැබිය යුතු උසාවි දඩ හා වීථි පහන් සඳහා ලැබිය යුතු මුදල් වන අතර අනෙකුත් ආදායම් බිල් කිරීම් වලට සාපේක්ෂව වර්ෂය තුළ රැස් කිරීමේ පැහැදිලි ප්‍රගතියක් පෙන්නුම් කෙරේ. |

### 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වරිපනම්** | | |
| ආරම්භක හිඟය රු.59,939,093 ක් වූ අතර, රු.36,696,436 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.96,635,529 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.40,780,935 ක් හෙවත් සියයට 42 ක අගයක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.55,854,594 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ගිණුම්කරණ දෝෂය ක් නිසා මෙය සිදුවී ඇත. එය හඳුනාගැනීමෙන් පසු නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.3.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **කඩ කුලී** | | |
| ආරම්භක හිඟය රු. 51,760,590 ක් වූ අතර, රු.22,411,271 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.74,171,861 ක් | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමින් පවතී. |

අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.20,600,086 ක් හෙවත් සියයට 27 ක අගයක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.53,571,775 ක් තරම් ඉහළ මට්ටමක පැවතුණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ව්‍යාපාරික බදු**<br>ආරම්භක හිඟය රු.812,900 ක් වූ අතර, රු.6,340,400 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.7,153,300 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.5,483,550 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟය රු.1,669,750 ක අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ මුදලින් සියයට 48 ක් අයකර ඇති අතර ඉතිරි මුදල සඳහා නඩු පැවරීමට කටයුතු කරමි. |
| **(ආ) දැන්වීම් පුවරු ගාස්තු**<br>ආරම්භක හිඟය රු.3,233,175 ක් වූ අතර, රු.18,522,908 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.21,756,083 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.14,927,823 ක් හෙවත් සියයට 25 ක අගයක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.6,828,260 ක අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ ශේෂයෙන් සියයට 48 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට නඩු පවරා ඇත. |

**2.3.6 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.764,995 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.332,178,721 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | උසාවි දඩ හිඟ මුදල ඉදිරියේදී ලැබීමට නියමිත අතර මුද්දර ගාස්තු ලබා දීම සීමා කිරීම නිසා ආදායම සභාව වෙත නොලැබෙන තත්ත්වයක් උද්ගත වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්ය සාධනය

----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන, සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------- |
|---|---|---|---|
| (අ) | කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්<br>--------------------------------------<br>කසළ භාවිතයෙන් ජීව වායු නිපදවා ඒ මගින් විදුලි බලය නිෂ්පාදනය කිරීමට රු.249,834,000 ක වටිනාකමින් යුක්ත ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට 2014 අගෝස්තු 08 දින පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. ව්‍යාපෘතිය 2015 ජනවාරි 01 දින අවසන් කළ යුතුව තිබුණද පහත සඳහන් හේතූන් සම්පූර්ණ නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කිරීමට නොහැකි වී තිබුණි. | අවශ්‍යතා සම්පාදනය කරගෙන ව්‍යාපෘතිය කඩිනමින් නිම කළ යුතුවේ. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවස්ථා ගණනකදී අතරමඟ නතර වූ අතර ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නෛතික ලේඛන සහ අනුමැතිය ආයෝජන සමාගම වෙත නොලැබීම හේතුවෙන් 2018 පෙබරවාරි මාසයේ සිට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත අතරමඟ නතර කරන ලදී. |
| (i) | විදුලිබල මණ්ඩලය විසින් විදුලිය මිලදී ගැනීමට එකඟතාවය පළ කිරීම (Letter of Intent/L.O.I) දක්වන ලිපිය ලැබී නොතිබීම. | | |
| (ii) | විදුලිය නිෂ්පාදනය කිරීමේ අවසරයට අදාළව සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලබා දිය යුතු බලපත්‍රය මෙතෙක් ලැබී නොතිබීම. (Energy permit) | | |
| (iii) | විදුලිය මිලදී ගැනීමට අදාළව විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම. (Power Purchasing Agreement/P.P.A) | | |

(iv) ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති වාර්තාවෙන් අලෙවි කිරීමට අපේක්ෂා කරන විදුලි ඒකකයක මිල ගණන් සඳහන් නොකිරීම නිසා විදුලිය අලෙවි කිරීමේ එකඟතාවය පිළිබඳ ගැටළු මතුවීම.

(v) කිසියම් කාල රාමුවක් තුළ මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු නිම කිරීම පිළිබඳ දෙවන ගිවිසුමේ කොන්දේසි නොමැති වීම.

(vi) මධ්‍යම පරිසර අධිකාරිය විසින් කිසිම තාක්ෂණික ඇගයීමක් සිදු නොකර රු.64,356,400 ක් නිදහස් කර තිබීම.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී කසළ එකතු කිරීම සඳහා රු.112,261,450 ක් හා අපද්‍රව්‍ය කළමනාකරණයට රු.102,438,890 ක් ලෙස රු.214,700,340 ක් වැයකර තිබුණි. බල ප්‍රදේශයේ වාර්ෂිකව එකතු වන අපද්‍රව්‍ය ප්‍රමාණය ට්‍රැක්ටර් ලෝඩ් 9,414 ක් ලෙස හඳුනාගෙන තිබූ අතර ඉන් ට්‍රැක්ටර් ලෝඩ් 8,810 ක ප්‍රමාණයක් පරිසරයට මුදාහැර ට්‍රැක්ටර් ලෝඩ් 604 ක් පමණක් ප්‍රතිචක්‍රීකරණය කර තිබුණි. 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මෙහෙයුම් ආදායමින් සියයට 27 ත් 39 ත් අතර ප්‍රමාණයක් සඳහා වියදම් දරා තිබුණද දෛනිකව එකතු වන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කර ගත හැකි ආකාරයට කළමනාකරණය කර ගැනීම සිදුවී නොතිබුණි. | අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කළ යුතුවේ. | මහා නගර සභා ආඥා පනතේ අංක 129 අනුව වියදම් දැරිය යුතු වේ. |

(ඇ) පාරිසරික ගැටළු
------------------

| | | |
|---|---|---|
| (i) 2015 වසරේ සිට වසර 04 ක කාලයක් තුළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි දිරන කසළ ට්‍රැක්ටර් ලෝඩ් 30,725 ක් හා ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසළ ට්‍රැක්ටර් ලෝඩ් 1,661 ක් ලෙස එකතුව කසළ ට්‍රැක්ටර් ලෝඩ් 32,391 ක ප්‍රමාණයක් අක්‍රමවත් හා අවිධිමත් ලෙස කොටවිල කසළ අංගනයට බැහැර කිරීම නිසා කසළ කන්දක් නිර්මාණය වී තිබුණි. මෙම කසළ කන්ද තුනී කිරීම සඳහා 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් මාසය දක්වා සභාවේ බැකෝ යන්ත්‍රයට පැය 2,703 ක් සඳහා ඉන්ධන වියදම් ලෙස රු.1,305,907 ක් හා පෞද්ගලික බැකෝ | පාරිසරික ගැටළු ඇති නොවන ආකාරයෙන් කසළ බැහැර කළ යුතුවේ. | පෙර පැවති කොම්පෝස්ට් අංගනය සහ කසළ තේරීම් පරිශ්‍රය පෞද්ගලික ආයතනයකට ලබාදීම නිසා කොම්පෝස්ට් නිෂ්පාදනය නතර වී ඇත. ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසු කසළ කන්ද වෙනුවෙන් විසඳුමක් ලබාදෙන අතර සභාවේ බැකෝ යන්ත්‍රය ප්‍රමාණවත් නොවීම නිසා කුලී පදනම මත ස්කැවේටර් |

| | | | |
|---|---|---|---|
| | යන්ත්‍රයක් සඳහා රු.2,632,745 ක් ගෙවීම් කර තිබුණි. | | යන්ත්‍රයක් ලබාගෙන ඇත. |
| (ii) | කසළ කන්ද නිර්මාණය වීමත් සමඟ ඩෙංගු හා වෙනත් රෝග පැතිරීමේ අවධානම වැඩි වී තිබුණි. කසළවලින් වැස්සෙන ශ්‍රාවය පරිසරයට එකතු වීම තුළින් පරිසරය දූෂණය වීම, දුර්ගන්ධය නිකුත්වීමෙන් වායු දූෂණය වීම හා කසළ අංගනය ආශ්‍රිතව පවතින දිය ඇලට අංගනයෙන් බැහැරවන අපිරිසිදු ජලය එකතු වීමෙන් ජල මූලාශ්‍ර දූෂණය වීමෙන් දිනෙන් දින මහජන විරෝධය වර්ධනය වී තිබුණි. | පාරිසරික ගැටළු ඇති නොවන ආකාරයෙන් කසළ බැහැර කළ යුතුවේ. | කසළ තුනීකිරීමේ කටයුතු සිදුකිරීම හා දින තුනකට වරක් ධුමායනය කිරීම, දුර්ගන්ධය පාලනය කිරීමට රසායනික ද්‍රව්‍ය ස්ප්‍රේ යන්ත්‍රයක් මිලදී ගැනීමට නියමිතය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------- |
| 2012 වර්ෂයේදී ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා රු.2,680,000 ක් වැය කර යතුරුපැදි 10 ක් මිලදී ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් යතුරුපැදි 06 ක් විවිධ අලුත්වැඩියා හේතු කොටගෙන ධාවන කටයුතුවලින් ඉවත් කර තිබුණි. මෙම යතුරුපැදි මිලදී ගැනීමේදී අමතර කොටස් ලබා ගැනීම, සේවා කටයුතු සිදු කිරීම වැනි කාරණා පිළිබඳ අවධානය යොමු නොකිරීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කළ රු.1,608,000 ක් වටිනා යතුරුපැදි 06 ක් අමතර කොටස් නොමැති වීමෙන් දිරාපත් වෙමින් පැවතුණි. | මිලදී ගැනීමේදී සියලු කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු අතර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශය කටයුතු කළ යුතුවේ. | අලුත්වැඩියාව සඳහා නියෝජිත ආයතනයෙන් ප්‍රතිචාරයක් නොමැති බැවින් මෝටර් රථ පරීක්ෂක ලවා පරීක්ෂාකොට ඉදිරි කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරු 01 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 20 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 73 ක් පුරප්පාඩු ලෙසද, ද්විතීයික හා ප්‍රාථමික මට්ටමේ තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ ඇතුළත් අතිරික්ත තනතුරු 09 ක් ඇතුළුව 131 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සහ අතිරික්ත විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන අතර අතිරික්ත තනතුරු සඳහා අනුමැතියට පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත.<br>කොන්ත්‍රාත් තනතුරු 122 මහා නගර සභා ආඥා පනතේ 40 වන වගන්තියේ (1) (අ) උප වගන්තියේ නගරාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල හා විධිවිධාන පරිදි බඳවාගෙන ඇත. |
| **(ආ) සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂ 10 කට පෙර විශ්‍රාම ගිය, මියගිය, සේවය අතහැරගිය සහ ස්ථානමාරුවී ගිය සේවකයින්ගේ ආපදා ණය, උත්සව අත්තිකාරම්, විශේෂ ණය, වාහන ණය සහ ගංවතුර අත්තිකාරම් සඳහා ලබාදුන් රු.330,229 ක මුදලක් අයවීමට තිබුණි. | සේවක ණය කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. | වර්ෂ 10 ඉක්මවූ අයකර ගැනීමට නොහැකි ණය ශේෂ, සභා තීරණ ප්‍රකාරව පොත්වලින් කපා හැරීම සඳහා ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී තණකොළ කපන යන්ත්‍ර 22 කට ඉන්ධන ලීටර් 4,200 ක් භාවිතා කිරීම වෙනුවෙන් රු.582,790 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් ලේඛන පවත්වා නොගැනීම නිසා එක් එක් යන්ත්‍රය සඳහා නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය, ඉන්ධන | විධිමත් අභ්‍යන්තර පාලනයක් හරහා ඉන්ධන නිකුත් කළ යුතුවේ. | ඉන්ධන නිකුත් කිරීමට ආකෘති පත්‍රයක් හඳුන්වා දී ඇත. 2019 මැයි මස මුල සිට ඉන්ධන ලේඛනයක් හඳුන්වා දුන් අතර, එය දැනට යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| | නිකුත් කළේ කුමන කාලයකටද යන්න හා ඉතිරි ඉන්ධන ප්‍රමාණය පිළිබඳ ගණනය කිරීමට නොහැකි විය.<br>ඉන්ධන නිකුත් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රයක් භාවිතා නොකිරීම. එක් එක් යන්ත්‍රය සඳහා ඉන්ධන භාවිතය සම්බන්ධ වාර්තා ඇතුළත් ලේඛනයක් පවත්වා නොගැනීම. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයට රක්ෂණ ආවරණ ලබාගත් වාහන 203 ක් මහා නගර සභාව සතුව පැවති අතර ස්ථිර රියදුරන් 39 දෙනෙකු වෙත එම වාහනවල රාජකාරි පැවරීමේදී වාහන ලිඛිතව භාරදීමක් සිදුකර නොතිබුණි. | වාහන වල රාජකාරි පැවරීමේදී ලිඛිතව භාර දීමක් සිදු කළ යුතුවේ. | වාහන පිළිබඳ සංගණනයක් කර වාහනවල තාක්ෂණික නොවන අඩුපාඩු හඳුනා ගනිමින් නියමිත ආකෘතියක් සකස් කර රියදුරන් වෙත ලිඛිතව වාහන භාරදීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන වියදම් ලෙස රු.9,619,157 ක මුදලක් දරා තිබූ අතර වාහන සඳහා රාජකාරි අවශ්‍යතා මත ඉන්ධන පරිභෝජනයේ උපරිම සීමාවන් පවත්වාගෙන ගොස් නොතිබුණි. එම සීමා ඉක්මවන අවස්ථාවල විශේෂ අනුමැතිය ලබා ගැනීමට සැලැස්වීමෙන් ඉන්ධන පරිභෝජනය පාලනය කිරීමට ද කටයුතු කර නොතිබුණි. | ඉන්ධන පාරිභෝජනය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇති කළ යුතුවේ. | ඉදිරියට එක් එක් වාහනය සඳහා ඉන්ධන පිළිබඳ උපරිම සීමාවක් පවත්වාගෙන යාමටත්, එම සීමාව ඉක්මවීමේදී විශේෂ අනුමැතියක් ලබා ගැනීමටත් කටයුතු කරමි. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තාර මිලදී ගැනීමේදී ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සිදුකළ යුතු බව දිස්ත්‍රික් මිල කමිටුව විසින් දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී තාර බැරල් 175 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීම වෙනුවෙන් රු.2,025,000 ක් වැයකර තිබුණි. | මිල කමිටු තීරණ මත ක්‍රියාත්මක විය යුතුයි. බැහැර වන අවස්ථා වලදී අනුමැතිය ලබා ගත යුතුවේ. | මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කමිටු තීරණ හා පරිපාලන කමිටු අනුමැතිය මත මිලදී ගැනීම් සිදු කර ඇත. |

## 3.6 හඳුනාගත් පාඩු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සෘජු ශ්‍රම පදනම මත කර්මාන්ත ඉටු කිරීම සඳහා ද්‍රව්‍ය අයිතම 05 ක් මිලදී ගැනීමේදී දිස්ත්‍රික් මිල කමිටු විසින් අනුමත කළ මිලට වඩා වැඩි මිලකට මිලදී ගැනීම හේතුවෙන් රු.678,018 ක පාඩුවක් සභා අරමුදලට සිදු වී තිබුණි. | දිස්ත්‍රික් මිල ගණන් අනුව මිලදී ගත යුතු අතර බැහැර වන අවස්ථා වලදී අනුමැතිය ලබා ගත යුතුවේ. | දිස්ත්‍රික් මිල ගණන් අනුව කුට්ටි ගල් සැපයීමට ආයතන නොතිබුණි. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සෘජු ශ්‍රම පදනම මත කර්මාන්ත 43 ක් ඉටු කිරීම සඳහා රු.6,177,479 ක විවිධ ගොඩනැඟිලි ද්‍රව්‍ය මිලදී ගෙන තිබූ අතර එම ද්‍රව්‍යවලින් රු.5,968,045 ක් වටිනා ද්‍රව්‍ය භාවිතා කර තිබුණි. පහත සඳහන් කටයුතු සිදු නොකිරීම නිසා සෘජු ශ්‍රමය මඟින් ඉටු කරන ලද කර්මාන්තවලට මිලදී ගත් ද්‍රව්‍ය හා ශ්‍රමය නිසි පරිදි යොදාගෙන නියමිත වැඩ කොටස් ඉටු කර තිබේද යන්න විගණනයට තහවුරු කර ගත නොහැකි විය.<br><br>එක් එක් කර්මාන්ත සඳහා ඇස්තමේන්තු හා ශ්‍රම විශ්ලේෂණ වාර්තා කස්කර නොතිබීම.<br><br>(i)<br>අදාළ කර්මාන්ත සඳහා ගබඩාවෙන් නිකුත් කරන ලද ද්‍රව්‍යවල නිකුත් කිරීමේ නියෝග පිළිබඳ පිටපත් කර්මාන්ත ලිපිගොනුවලට ඇතුළත් නොකිරීම.<br>(ii)<br>එක් එක් කර්මාන්තය සඳහා භාවිතා කළ පුහුණු ශ්‍රමය හා නුපුහුණු ශ්‍රමය සම්බන්ධ චෙක් රෝල් කර්මාන්ත ලිපිගොනුවලට ඇතුළත් නොකිරීම. | කර්මාන්ත ලිපි ගොනුවල සියලු විස්තර ඇතුළත් කළ යුතු අතර විධිමත් පරිදි ද්‍රව්‍ය ඇස්තමේන්තු සකස් කළ යුතුවේ. | කර්මාන්ත සඳහා වැය වන ද්‍රව්‍ය හා ශ්‍රමය ඇතුළත්ව වැඩ විෂයන්ට අදාල වන පරිදි ද්‍රව්‍ය ඇස්තමේන්තු සකස් කර නිම කරමින් පවතී. කර්මාන්තවල නිකුත් කිරීමේ නියෝග පිටපත් කඩිනමින් ලබා ගෙන ගොනුවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. පුහුණු හා නුපුහුණු ශ්‍රමය සම්බන්ධ චෙක් රෝල් මේ වන විට කර්මාන්ත ලිපි ගොනුවට ඇතුළත් කිරීමට කටයුතු සලසා ඇත. කර්මාන්ත අවසන් කිරීමෙන් පසු වැඩ අවසන් වාර්තාව අදාල ගොනුවලට ඇතුළත් කරනු ලබන අතර, එසේ කළ නොහැකි වූ කර්මාන්ත සඳහා නිමි වැඩ වාර්තා සකස් කර ගොනුවලට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | කර්මාන්තය අවසානයේදී නිමිවැඩ වාර්තා සකස් කර ඉතිරි ද්‍රව්‍ය ගබඩාවට භාර දී නොතිබීම. | කර්මාන්ත ලිපි ගොනුවල සියළු විස්තර ඇතුළත් කළ යුතු අතර වියිමත් පරිදි අදාළ වාර්තා සකස් කළ යුතුවේ. | |
| (iv) | | | |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මාර්ග 03 ක් සෘජු ශ්‍රම පදනම මත ඝණ මීටර් 16.23 ක් කොන්ක්‍රීට් කර තිබුණද නියමිත කාලය තුළදී කොන්ක්‍රීට් අතුරන ලද මාර්ගයේ ශක්තිය පරීක්ෂා කර වාර්තා ලබා ගෙන නොතිබුණි. | කොන්ක්‍රීට් කිරීමෙන් අනතුරුව නියමිත කාලය තුළදී ශක්තිය පරීක්ෂා කිරීමේ වාර්තා ලබාගත යුතුවේ. | ඉදිරියේදී තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 04 ක ඉතිරිවීම් වල එකතුව රු. රු.57,627,766 ක් වූ අතර එම අගයන් සියයට 12 සිට සියයට 46 දක්වා පරාසයක පැවතුනි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | සමස්තයක් ලෙස අයවැය සීමාව ඇතුළත වියදම් සිදු කර ඇත. |

## 4.2 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 දරන චක්‍රලේඛයේ 8.1 වගන්තිය වැරදි ලෙස අර්ථකථනය කර, මුද්දර ගාස්තු ආදායම් එකතු කිරීම වෙනුවෙන් මහා නගර සභාවේ නිලධාරීන් 11 දෙනෙකුට රු.1,365,965 ක කොමිස් මුදල් ගෙවා තිබුණි. | නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ සභාවේ අවධානය යොමු කළ යුතුය. | කොමිස් මුදල් ගෙවීම් නතර කිරීමෙන් පසු පිටපළාත් වලින් ලැබිය යුතු මුද්දර ගාස්තුවලින් කිසිදු මුදලක් ලබා ගැනීමට කටයුතු කර නොමැත. |